ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1986 අංක 8 දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 මාර්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 8 දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 මාර්තු මස 20 වන දින.]

එල්. ඩී.—ඕ. 36/84

**1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත, 1986 අංක 8 දරන පොල් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 19 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **1971 අංක 46 දරන පනතේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

(2අ) පොල් නිෂ්පාදන කිසිවක් අපනයනය කිරීම සම්බන්ධයෙන් 23 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඈ) ඡේදයෙහි සඳහන් බලතල, මණ්ඩලය වෙත පවරා ඇති අවස්ථාවක, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුදුසුකම්, නියම සහ කොන්දේසි සහ කාර්ය පරිපාටිය අනුව ඒ පොල් නිෂ්පාදනය අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව යම් වාණිජ බැංකුවක් වෙත පවරනු ලැබිය හැකි ය.

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "(2) වන උප වගන්තිය යටතේ" යන යෙදුම වෙනුවට "(2) වන උප වගන්තිය හෝ (2අ) වන උපවගන්තිය හෝ යටතේ" යන යෙදුම ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ "පොල් නිෂ්පාදනය" යන අර්ථ නිරූපනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"වාණිජ බැංකුව" යන්නෙන්, ඉල්ලුම් තැන්පතු ඇතිකිරීමේ හෝ මහජනයාගෙන් භාර ගැනීමේ හෝ ව්‍යාපාරයක් ශ්‍රී ලංකාවේ පත්වාගෙන යන්නා වූ සංස්ථාගත හෝ සංස්ථාගත කරනු නොලැබූ යම් තැනැත්තෙක් නැතහොත් පුද්ගල මණ්ඩලයක් අදහස් වන නමුත්, ශ්‍රී ලංකා මහ බැංකුව ඊට ඇතුළත් නොවන්නේ ය."

2—ඒ 088764—6,950 (86/01)

වලංගු කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තිය මගින් පිහිටුවන ලද පොල් සංවර්ධන අධිකාරිය විසින් හෝ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක් විසින් හෝ බලපත්‍ර නිකුත් කිරීමේ බලය වලංගු නැති ලෙස වාණිජ බැංකුවක් වෙත පවරා තිබීමේ හේතුව නිසා පමණක්, මේ පනත ආරම්භ වීමට පෙර, ඒ බැංකුව විසින් යම් පොල් නිෂ්පාදන අපනයනය කිරීම සඳහා නිකුත් කරන ලද කිසිදු බලපත්‍රයක් අවලංගු වී ඇතැයි හෝ අවලංගු වෙතැයි හෝ සලකනු නොලැබිය යුතු ය.